# මහාවංසයේ සඳහන් පුරාතන නගර පිළිබඳ විමර්ශනයක්

කේ.ඒ.ආර්. ප්‍රසංගා[1]

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනගා ගැනීමේ කාර්යයේදී සාහිත්‍ය කෘතියක් වන මහාවංසයෙන් ලැබෙන පිටුවහල ඉතා විශාල වේ. පුරාණයේ ශ්‍රී ලංකාවේ පැවති ගම් සහ නගර පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ප්‍රධාන මූලාශ්‍රයක් වශයෙන් මහාවංසය නමැති ඓතිහාසික ග්‍රන්ථය ඉතා වැදගත් කාර්යයක් ඉටු කරයි. මහාවංසය කෘතිය තුළ සඳහන් වන්නේ අතීතයේ සිටි රජවරුන්ගේ ආගමික සහ දේශපාලන සංසිද්ධීන් පිළිබඳ විස්තර ඇතුළත් ඓතිහාසික තොරතුරු නිසා එම කාලයේ විසූ සාමාන්‍ය ජනයා හෝ ජනයාගේ ජන ජීවිතය පිළිබඳ තොරතුරු දැකීම ඉතා විරල වේ. අතීතයේ ශ්‍රී ලංකාව පාලනය කරන ලද රජවරුන්ගේ දේශපාලනික හා ආගමික අනුග්‍රහයන් විස්තර කරනු ලබන අවස්ථාවන්වලදී එම සිද්ධීන් සිදු වූ ප්‍රදේශය පිළිබඳව සඳහන් කරන ලද අවස්ථාවන් ද දක්නට ලැබේ. එවැනි අවස්ථාවන්වලදී පුරාණ ගම සහ නගරය පිළිබඳව දක්නට ලැබෙන තොරතුරු හා ස්ථාන නාම පිළිබඳව කිසියම් අදහසක් ලබාගැනීමට හැකි වේ. මහාවංසය පළමු වැනි කොටස තුළ ක්‍රිස්තු පූර්ව පස් වැනි සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ තුන් වැනි සියවස දක්වා ශ්‍රී ලංකාවේ සිදු වූ ආගමික සහ දේශපාලනික සංසිද්ධීන් ඇතුළත් වේ. මෙම සංසිද්ධීන් අධ්‍යයනය කරන විට එම සංසිද්ධීන් සිදු වූ කාල වකවානුවල දී ශ්‍රී ලංකාව තුළ ජනාවාස වී තිබූ ප්‍රදේශ සහ එම ප්‍රදේශවල නම් එම ප්‍රදේශවල තිබූ ග්‍රාමීය සහ නාගරික පරිසරය පිළිබඳ තොරතුරු හඳුනාගත හැකිය. තත්කාලීන ගම සහ නගරය තුළ ඇතුළත් වූ අංගෝපාංග, ග්‍රාම නාම, එම ගම්වල සීමාවන්, එම ග්‍රාමයන්හි පාලනය, නාගරික පාලනය, හා නාගරික පරිසරය පිළිබඳව තොරතුරු ද එහි අන්තර්ගත වී තිබේ. මහාවංසය කෘතිය අනුව මුල් අනුරාධපුර යුගය තුළ ශ්‍රී ලංකාව තුළ පැවති ප්‍රධාන නගරවලින් කිහිපයක් ලෙස අනුරාධපුර, විජිත නගර හා මහේල නගර හඳුනාගත හැකිය. මෙම පුරාණ නගර සම්බන්ධ ලිඛිත සාධක තුළින් අතීතයේ පැවති නගරයක වාස්තුවිද්‍යාත්මක අංග කුමන ආකාරයේ වී ද යන්න පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වේ. ඒ අනුව අතීතයේ ශ්‍රී ලංකාවේ නගරයක් සැලසුම් කිරීමේ දී අවධානය පැවති වාස්තුවිද්‍යාත්මක දැනුම හා තාක්ෂණය කුමන ආකාරයේ ද යන්න අධ්‍යයනය කිරීම කළ හැකිය. මෙහි දී මහාවංසය ප්‍රධාන ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සලකා මෙම අධ්‍යයනය සිදුකර ඓතිහාසික යුගයේ මෙරට පුරාතන නගරයක තතු පිළිබඳ විමර්ශනය කරන ලදි.

**ප්‍රමුඛ පද :** මහාවංසය, අනුරාධපුර, විජිත නගරය, මහේල නගරය, වාස්තුවිද්‍යාව

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.roshniprasanha@mail.com